තේ තතු

පර්යේෂණ ක්ෂේත්‍රයේ 75 වසරක අභිමානය
75 வருட ஆய்வின் சாதனை
75 Years of Research Achievement

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA
SALUS UNITAS NOSTRA
INCORPORATED 1925

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි

ISSN - 1391-6785

දෙවන කාණ්ඩය, දෙවන කලාපය 2002 ජූලි - දෙසැම්බර්

# පරිසරය සුරකිමින් තේ වවමු.

පරිසරය රැක ගැනීම ගැන පෙර නොතිබූ තරමේ උනන්දුවක් අද ලොව පුරා පවතී. එම නිසා තේ වගාකරුවන් වන අප ද පාරිසරික ගැටළු අවම කර ගනිමින් වැඩි ඵලදායිතාවයකින් යුත් තේ වගාවක් පවත්වා ගැනීමට උත්සාහ කළ යුතු අතර ඒ සඳහා තේ පර්යේෂණායතනය විසින් නිර්දේශ කොට ඇති කෘෂි විද්‍යාත්මක උපක්‍රම ගැන සොයා බැලීම කාලීන වැදගත් කමකින් යුක්ත වේ.

තේ වගාව ආශ්‍රිත පස එම පරිසරයේ ඇති වැදගත්ම සාධකයකි. තේ වගාවෙන් වැඩි ඵලදායිතාවයක් ලබා ගැනීමට නම් පස රැක ගැනීම සඳහා උපාය මාර්ග අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ. තේ වගාව සඳහා සුදුසු බිමක් තෝරා ගත් අවස්ථාවේ දීම එම බිමෙහි ස්වභාවය අනුව නිශ්චිත පරතරයකට සමෝච්ච රේඛා පදනම් කරගත් කානු පද්ධතියක් සැකසිය යුතුය. එසේ සකස් කරන නිර්දේශිත කුට්ටි කානු සහ වලවල් සහිත කුට්ටි කානු මගින් මෙන්ම ඒවා සම්බන්ධ වන නෙත්ති කානු මගින්, ජලයත් සමග පස සේදී යාම අවම කිරීම මෙන්ම පසේ තෙතමනය රඳා ගැනීමේ හැකියාව වැඩි වීමද සිදුවේ. කානු පද්ධතිය සකස් කර ගැනීමට අමතරව ගල් වැටි බැඳීම මගින් ද බෑවුම් නිසා ඇති වන පස සෝදා යාම අවම ක. ගත හැක. මීට අමතරව තේ වගා කිරීමට අවම වශයෙන් වසර 2 කට පමණ පෙර සිට මානා හෝ ගෞතමාලා වැනි තෘණ වර්ගයක් වගා කොට පස පුනරුත්ථාපනය කර පසේ ව්‍යුහය වැඩි දියුණු කල යුතුය.

තේ වගාකරන බිමෙහි නියමිත පරතර වලින් යුතුව නිර්දේශිත සෙවන ගස් වගා කිරීම මෙන්ම නූතන කෘෂි විද්‍යාත්මක උපක්‍රමයක් වන සෝල්ට් (SALT) ක්‍රමය ද අප ආයතනය මගින් නිර්දේශ කර තිබේ. මෙසේ සෙවන ගස් මෙන්ම ක්‍රමයට අනුව සිට වූ ශාක විශේෂද වරින් වර කප්පාදු කිරීමෙන් එම ශාඛ ද්‍රව්‍ය කොළ පොහොරක් ලෙස පසට එකතු වේ. එවිට පසෙහි කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය ඉහල ගොස් පස සෝදා යාම අඩු වී පසේ තෙතමනය රඳවා ගැනීමේ හැකියාවද වැඩි කරන බව අප විසින් පසක් කොට ගෙන ඇත්තෙමු. ඉහත ආකාරයෙන් පසේ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය ඉහල යාම රසායනික පොහොර යෙදීමේදී එම පොහොර මගින් වැඩි ප්‍රයෝජන ලබා ගැනීමටද උපකාර වේ.

වැඩි අස්වැන්නක් සඳහා තීරණාත්මක සාධකයක් වන රසායනික පොහොර භාවිතයේ දී එක් එක් වගා බිමෙහි අස්වැ. ප්‍රමාණය මත පදනම් වූ නියමිත පොහොර ප්‍රමාණය පමණක්, නිර්දේශිත කාල පරාස වලදී භාවිතා කිරීමෙන් එම පොහොර භාවිතය මනා ලෙස හැසිරවීමට හැකි වේ. එමෙන්ම හැකි සෑම අවස්ථාවේදීම කාබනික පොහොර වර්ග භාවිතා කිරීම ද පාරිසරික ගැටළු අවම කිරීමට හේතුවේ.

පලිබෝධනාශක භාවිතය පාරිසරික ගැටළු ඇති කිරීමට හේතු වුවද එය නූතන කෘෂිකර්මය හා වෙන් කල නොහැකි අන්දමින් බැඳී පවතී. එහෙත් තේ වගාවේදී එම ගැටළු බොහෝ දුරට අවම කර ගත හැකි උපාය මාර්ග කොතෙකුත් තිබේ. කෘමිනාශක භාවිතා කිරීමේදී නිර්දේශිත මාත්‍රාව වෙනස් නොකොට භාවිතා කිරීමෙන් එම රසායන ද්‍රව්‍ය අවම ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි අතර එම ද්‍රව්‍ය අනවශ්‍ය ලෙස පරිසරයට එකතුවීමද වැලකේ. මීට අමතරව පලිබෝධ පාලනය සඳහා රසායනික ක්‍රම මතම යැපෙන්නේ නැතිව මිනිස් ශ්‍රමය යොදා ගැනීම, යාන්ත්‍රික ක්‍රම, ජීව විද්‍යාත්මක ක්‍රම ආදියෙහි සම්මිශ්‍රණයක් වූ සමෝධානික (ඒකාබද්ධ) ක්‍රමයක් යොදා ගැනීම වඩාත් යෝග්‍ය වේ. එමගින්, යොදන රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය අවම කර ගත හැක.

පසුගිය කාලයේ දී තේ තවාන් පස් ජීවානුහරණය සඳහා භාවිතා කළ මීතයිල් බ්‍රෝමයිඩ් රසායනික ද්‍රව්‍යය, ඕසෝන් ස්ථරයට හානිදායක වන බව සොයා ගත් අතර ඒ වෙනුවට හානිකර නොවන රසායනික ද්‍රව්‍ය මෙන්ම සූර්ය තාපයෙන් පස් ජීවානුහරණය කිරීම සහ තේ පැල වලට හානි කරන නෙමටෝඩාවන්ට අහිතකරවන සංයෝග පසට එකතු කරන සූරියකාන්ත වැනි ශාක විශේෂ තේ වගා බිමෙහි වගා කිරීම වැනි ක්‍රමද හඳුන්වා දීම මේ ක්ෂේත්‍රයේදී තේ පර්යේෂණායතනය ලැබූ විශාල ජයග්‍රහණයකි.

ඉහත කරුණු සියල්ලටම අමතර ව එසේ හානිකර නොවන වෙනත් රසායනික ද්‍රව්‍ය මෙන්ම තේ පර්යේෂණායතනය විසින් නිර්දේශ කර ඇති, පලිබෝධකයන්ට සාර්ථකව ඔරොත්තු දෙමින් අවම පොහොර ප්‍රමාණයකින් වැඩි අස්වැන්නක් ලබා ගත හැකි නව ක්ලෝන වර්ග වගා කිරීමෙන් පාරිසරික හානිය ද අවම කරගෙන තේ වගාවෙන් උපරිම ඵලදාවක් ලබා ගැනීමට ඔබට නිසැකවම හැකි වනු ඇත.

**නොයෙල් පියසුන්දර**